Page 1 October 2011.qxd 18/10/2011 16:00 Page 1


# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 14
NUMBER 06

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

OCTOBER 10, 2011 ඔක්තෝබර් මාසය (බුද්ධ වර්ෂ 2555 වප් මාසය) http://www.lankaheritage.com/lankaviththi/




# වැරදුණු කුරුමානම

♦ සංජය විමලරත්න විසිනි



**දඩයමකදී ගොදුරුකර ගැනීමට අද හස් කරන සතාට හරියටම වදින සේ තුවක්කුව හෝ හීය එල්ලයට සකසා ගැනීම කුරුමානම් ඇල්ලීම යයි කියනු ලබයි. කොපමණ සූදානම් වුවද යම් යම් හේතූන් නිසා කුරුමානම වැරදී ගොදුර බේරී යන අවස්ථාද ඇත. එවිට එය වැරදුණු කුරුමානමක් වෙයි. දඩයමේදී පමණක් නොව ජාත්‍යන්තර කටයුතු වලදී පවා යම් ඉලක්ක කරගත් දෙයක් වැරදීගිය විට එය වැර දුණු කුරුමානමක් වන්නේය. පසුගිය දිනවල පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේදී ශ්‍රීලංකා වට සතුරු බලවේග විසින් කූට උප ක්‍රම යොදා ගනිමින් අපරට ගොදුරු කරගන්නට කරන ලද දීන ප්‍රයත්නයක් වැරදී ගිය අයුරුය මේ ලිපියෙන් අප අද ඔබට ඉදිරිපත් කරන්නේ.**

මෙය නිකම්ම ඉබේම සිදුවූවක් නොවේ. අප රට අද අපේ සතුරන් හා මිතුරන් කවුරුදැයි හඳුනාගෙන කල්පනාකාරී ලෙස මෙන්ම නොබියව කටයුතු කළ නිසා මෙම සාර්ථක ප්‍රතිඵලය ලබාගත හැකිවී ය.

## කොටි නැට්ට

කොටි ත්‍රස්තවාදය රට තුළ විනාශ කරනු ලැබූවද පිට රටවලට පැනගොස් සිටින කොටි ව්‍යාපාරයට හිතවත්, ඩයස්පෝරාව වශයෙන් හඳුන්වනු ලබන, සුළු කොටස හෙවත් ශේෂය, **Tiger Terrorist Rump** යනුවෙන් භාවිතයේදී හඳුන්වනු ලබයි. මෙම ශේෂය සිංහළෙන් අපි **කොටිනැට්ට** යනුවෙන් හඳුන්වමු. ජේ. ආර්. ජයවර්ධනගේ කාලයේ සිටම අපේ රටේ බලයට ආ ආණ්ඩු සහ පුද්ගලයින් බොහෝ විට දේශපාලන වශයෙන් ගෙන ගිය මුග්ධ ක්‍රියාකලාප නිසාත්, වෙල්වනායගම් වැනි දේශීය සතුරන් ද්‍රවිඩ ජනකොටස් තුළ පැලකළ ජාතිභේදවාදී විශම අදහස් නිසාත් කොටියා විනාශ වුවද මෙම කොටිනැට්ට තවම පවතියි. දශක තුනක පමණ කාලයක් විදේශ රටවලට වී මෙම කොටිනැට්ටේ අය යුද සමයේදී කළේ කොටි ව්‍යාපාරයට මුදල් එකතුකිරීම හා යුද්ධයට උදව් වීමය. 2009 දී ශ්‍රීලංකාව තුළ කොටි විනාශ කළාට රජය විසින් පසු කොටිනැට්ටේ සමහර කොටස් අත්අඩංගුවට ගැනීම කරනු ලැබුවත් බටහිර රටවල සිටි නැට්ටේ කොටස් දිගටම ක්‍රියාකාරී වූහ.

දැන් යුද්ධයට යොදවනවා වෙනුවට තවමත් බෙදුම්වාදී බීජය රෝපණය කරමින් ඩයස්පෙ-ෝරාව තුළ ඊළාම් සිහිනය අළුත්කොට මවමින් හොඳින් හෝ නරකින් තවමත් මුදල් එකතුකරමින් කොටිනැට්ටේ ක්‍රියාකාරීහු අප රටේ ප්‍රතිරූපය බිඳ හෙළීමට හැකි හැම උත්සාහයක්ම දරති.

දැන් යුද්ධයට යොදවනවා වෙනුවට තවමත් බෙදුම්වාදී බීජය රෝපණය කරමින්, ඩයස්පෝරාව තුළ ඊළාම් සිහිනය අළුත්කොට මවමින්, හොඳින් හෝ නරකින් තවමත් මුදල් එකතුකරමින් කොටිනැට්ටේ ක්‍රියාකාරීහු අප රටේ ප්‍රතිරූපය බිඳ හෙළීමට හැකි හැම උත්සාහයක්ම දරති. 2008 සිට බටහිර රටවල් භාජනය වී සිටින ආර්ථික, එමෙන්ම දේශපාල නික අර්බුදය ප්‍රයෝජනයට ගනිමින් හැකි සෑම ආකාරයකින්ම අපට මඩගසන්නට බලති. බටහිර රටවල ආර්ථික අර්බුද මෝරත්ම බංකොළොත් ගසා සිටින හැම පක්ෂයකම දේශපාලනඥයින්ට ළංවී මොව්හු මේ විශම ව්‍යාපාරය ගෙන යති. "යුද්ධයෙන් කර ගැනීමට බැරිවූ ඊළාම් රාජ්‍යය පිහිටුවා ගැනීම ආර්ථික හා වෙන උපක්‍රම වලින් අපි පිහිටුවා ගන්නවා " යයි කොටිනැට්ටේ සමහර අය උදම් අනා ඇති බව ද අපි දනිමු.

## මානව අයිතිවාසිකම් තවලම

යුද්ධය අවසන් වූ පසු රජයේ සම්පූර්ණ අවධානය සහ ක්‍රියාකාරීත්වය යොමුවූයේ විනාශ වූ ප්‍රදේශ, සේවාවන් ආදිය ගොඩනැගීම මෙන්ම අවතැන්වූ ජන සමූහය හැකි ඉක්මනින් ස්ථාවර තත්වයකට ගෙන ඒමය. යුද සමයේදී රජය ක්‍රියාකළ ආකාරය තුළ මුල සිටම සිවිල් වැසිය-ආරක්ෂා කිරීම ප්‍රබල මෙන්ම ප්‍රථම ඉලක්කය වූ බව නොරහසකි. යුද්ධය අවසන් සමයේදී කොටි නැට්ටේ මේ බටහිර රටවල සමහර ප්‍රචාර සහ බලපෑම් නිසා සමහර ප්‍රධාන පුවත්පත් වලද අමූලික බොරු දමමින් වාර්තාකරුවන් දීන ව්‍යාපාර යක් ගෙන ගිය බව අපි දුටු වෙමු. යුද්ධය අවසන් වූ පසු මෙම ඝෝෂාව නැතිවිය. හරි යට සාක්ෂි සහිත සත්‍යයන් තිබුණානම් මොවුන් එසේ නිශ් ශබ්ද වේවිද? මානව අයිති වාසි කම්කාරයෝ නිකම් සිටීවිද?

යුද්ධය අවසන් වන සමයේදී මානව අයිතිවාසිකම් උල්ලංඝ නය වූයේ යයි යන ප්‍රශ්නය මතුවූයේ කලකට පසුවය. ඒ මේ ලියුම්කරුගේ මතකයේ හැටි යට අසාර්ථක ලෙස ජනාධි පතිධූරය සඳහා තරඟ කළ සරත් ෆොන්සේකා විසින් කරන ලද මුග්ධ, අදූරදර්ශී **සුදුකොඩි** කතාවෙනි. පසුව ඔහු එය ඉල්ලා අස්කර ගත්තද, එයින් විය යුතු හානිය එවිට සිදුවී අවසන්ය.

එය එපමණ දුරට රට ඇතුළේ නොගියද මෙම තවලම පිටරටවලට ගෙන යනු ලැබුයේ කොටි නැට්ට සහ ඩයස්පෝරාව විසිනි. ඔනෑම අමූලික බොරුවක් වැඩි ශබ්දයෙන් හඬගා පුන පුනා කිව් තරමට එය සත්‍ය යක් වශයෙන් පිළිගනු ලැබේය යන ගොබෙල්සියානු න්‍යාය උපයෝගී කරගනිමින් ඔව්හු එය ඉදිරි යටම ගෙනගියහ. ඔවුන්ට අවශ්‍ය වූයේ කොටි නායකයින් සියල්ල සමූල ඝාතනය කිරීම ගැන අප රටෙන් සහ නායකයින්ගෙන් පලිගැනීමටය.

ශ්‍රීලංකාව තුළද රජයට එරෙහි ඇතැම් පුද්ගලයින්ද සමහර පුවත්පත්ද මෙහිදී රජය විවේචනය කරමින් කළ කී දෑ ද කොටි නැට්ටන්ගේ ක්‍රියා පටිපාටියට

4 වන පිටුවට →

සුන් දර වදන් තෙපලන දොඩමලු දෙඇස
මන් නඳ සිනාවෙන් තව ඔපවෙයි රහස
සුන් කර හරින සිත නැගි කළුවර දහස
පුන් සඳ නුඹද පායන සැන්දෑ අහස?

**Sweet words are pouring out through chatty eyes**
**Slight alluring smile enhancing the secret more**
**Effacing mind's thousand glooms that cloud it high**
**Are you the full moon that beams in the evening sky ?**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*




අප සැමගේ විශ්වාසය දිනූ
FAST CASH
SEND TODAY - COLLECT TODAY
විස්තර පිටු අංක 3